සති පාසල

7 ශ්‍රේණිය | ගණිතය | සැප්තැම්බර් 5වන සතිය

25 - ඝන වස්තු

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- පෙළ පොතෙහි පිටු අංක 124 සිට 126 දක්වා ඇති **සමචතුරස්‍ර පිරමීඩය** පිළිබඳව අධ්‍යයනය කරන්න.
- පිටු අංක 125 හි ඇති ක්‍රියාකාරකම 1 හි නිරත වන්න.
- පෙළ පොතෙහි පිටු අංක 126 සිට 128 දක්වා ඇති **ත්‍රිකෝණ ප්‍රිස්මය** පිළිබඳව අධ්‍යයනය කරන්න.
- පිටු අංක 127 හි ඇති ක්‍රියාකාරකම 3 හි නිරත වන්න.
- පිටු අංක 128 හා 129 යටතේ ඇති **ඔයිලර් සම්බන්ධතාව** පිළිබඳව අධ්‍යයනය කරන්න
- පෙළ පොතෙහි පිටු 128 හි ඇති 25.1 අභ්‍යාසයේ නිරත වන්න.
- පෙළ පොතෙහි පිටු 129 හා 130 හි ඇති 25.2 අභ්‍යාසයේ නිරත වන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී ගර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය ගණිතය දෙවන පෙළ පොත (පිටු අංක 123 සිට 130)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=62#section-26
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=987&section=27
- DP Education
  https://www.youtube.com/watch?v=Vlso8cPii5c&list=PLcUOoycaDS-k0dtIfHHriJpJmc3V0Ouz4&index=27

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- සමචතුරස්‍ර පිරමීඩයේ ලක්ෂණ හඳුනා ගැනීම.
- ත්‍රිකෝණ ප්‍රිස්මයේ ලක්ෂණ හඳුනා ගැනීම.
- ඔයිලර් සම්බන්ධතාව හඳුනා ගැනීම.

04. ඇගයීම

1) i) ආධාරකය සමචතුරස්‍රයකින් හා ඉතිරි මුහුණත් 4 හැඩයෙන් හා ප්‍රමාණයෙන් එක සමාන ත්‍රිකෝණ 4කින් සමන්විත ඝන වස්තුවේ නම ලියන්න.

ii) සමචතුරස්‍ර ආධාරකය සහිත මෙම ඝන වස්තුවේ දාර ශීර්ෂ හා මුහුණත් ගණන වෙන වෙනම ලියා දක්වන්න.

iii) සමචතුරස්‍ර පිරමීඩයක පතොරමක් අඳින්න.

iv) ඝන වස්තු සඳහා භාවිතා වන ඔයිලර් සූත්‍රය ලියා දක්වන්න.

2) i) දාර 18 ක් සහිත ඝන වස්තුවක ශීර්ෂ හා මුහුණත් ගණන සමාන වේ. මෙම ඝන වස්තුවේ ශීර්ෂ ගණන සොයන්න.

ii) ඝනකයක් මත ඒ හා සමාන පතුලක් සහිත සමචතුරස්‍ර පිරමීඩයක් සවිකල විට ලැබෙන ඝන වස්තුවේ දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න.

iii) ඉහත (ii) හි සඳහන් සංයුක්ත ඝන වස්තුවේ රූපයක් අඳින්න.